# මහගම සේකරගේ පළමු නවකතාව පළ වුණාද?

**මෙරට පහළවූ විශිෂ්ට කවියකුවන 'මහගම සේකරගේ 46 වැනිඅනුස්මරණ දිනය මේ මස 14 වැනිදාට යෙදේ. මේ ලිපිය ඒ නිමිත්තෙනි.**



**මගේ අතිශය කුලුපග, සෙන්හබර මිතුරෙකුගේ හදිසි අභාවය පිළිබඳ හද හඬවන පුවත පළමු වරට මා කන්හි වැකුණේ 1976 අවුරුද්දේ ජනවාරි මස 15 වැනිදා, ප්‍රභාත කාලයේ ගුවන්විදුලිය ඔස්සේය. එකල ගුවන්විදුලි අසන්නන් තුළ තුළ නම රැන්දූ අමරචන්ද්‍ර රූපසිංහ නම්, මා කලණ මිතුරු ,හඬින් සරු , බසින් පුරු , ඇසූ පිරූ නිවේදකයාගේ අනනුකරණීය හඬිනි ඒ.1976 ජනවාරි 14 වැනි ද මැදියම් රැයේ එසේ අවසන් සුසුම් හෙළ මුදා හැරියේ කවි ගී ලොව ශේඛරායමාන මහගමසේකර මා සුමිතුරාය.**

ඔහුගේ දයාර්ද්‍ර හදේ රිද්මය හොසිතු නොපැතූ විරූ ලෙස එසේ නැවතී ගියේ විශ්වයේ රිද්මය විෂය කොටගෙන තමා විසින් ලියන ලද ආචාර්ය උපාධි නිබන්ධයේ සෝදුපත් බලමින් සිටින කල්හිය. සේකරයන් සදහටම අප අතැර ගිය 1976 ජනවාරි 14 වැනි දින පටන් 2022 අවුරුද්දේ ජනවාරි 14 වැනි දිනට පුරා 46 වසරකි. එහෙත් ඔහුගේ සෞන්දර්ය උරුමය පරපුරෙන් පරපුරට නව කවි සිත් සොයමින් ලමින් නවමින් ගලා යයි.

මා ළඟතෙත් මිත් මහගම සේකරයන්ගේ ගුණ වෙසෙස් මගේ මතකයෙන් කිසි ද මැකී නොයයි. මා ගමනි ලා ඔහු පිළිබඳව හෙළි කරන සැඟවුණු පුවත මගින් සේකරයන්ගේ පුද්ගල සන්තානයේ මෙන්ම ලේඛක චරිතයේද අදෘෂ්ට පූර්ව අංශයක් එබට හඳුනාගත හැකි වනු ඇතැයි මම සිතමි. මහගම සේකරයන්ගේ නිර්මාණ පරිශීලනය කොට ඇති කවිශේඛරයන් නොයෙක් ප්‍රශ්නය අසන්න. මහාගමසේකරයන්ගේ පළමු වන නවකතාව කුමක්ද? ඊට කෙළින්ම ලැබෙන පිළිතුර එක නියැකටම දන්නෙකිය. 'තුංමංහන්දිය', 'තුංමංහන්දිය', 'තුංමංහන්දිය' යැයි පිළිතුරු සපයන්නා තුන් වරක්ම හඬ නා කියනු නියතය.එහෙත් එය එසේ නොවන බව පසක් කලයම දන්නෝ සේකරයන්ගේ කුලුපගම , සද්විහාරික ,සමකාලීන මිතුරෝ දෙදෙනෙක් පමණි.ඔවුනු දෙදෙනාම තවමත් ජීවතුන් අතරය. එහෙත් අනාගතය ඒ දෙදෙනාම නවම ජීවත් වීම වාසනාවකි. යම් හෙයකින් ඒ දෙදෙනාගෙන් එක් අයෙක් අනිකාට පෙර මිය පරලොව ගොස් සිටියේ නම් ප්‍රවෘත්ත සත්‍යතාව සනාථ කිරීමට ප්‍රත්‍යක්ෂ සාක්ෂයක් අදාශමාන බැවින් එය ශංකාවට භාජනය වන තත්ත්වයක් උද්ගත වීම කාට වැළැකිය හැකිද?ඉහත සඳහන් දෙදෙනාටම 'තුංමංහන්දිය' සේකරයන්ගේ පළමු වැනි නවකතාව නොවන්නේ ඔවුන් දෙදෙනාම සේකරයන්ගේ පළමු වැනි නවකතාව ඔහුගේ කටින්ම හඬ නගා කියවද්දී ඒ බෝ වන තුරුම අසා සිටි බැවිනි. මගේ සත්මිත්‍ර සුනන්ද මහේන්ද්‍රයෝ ඒ දෙදෙනාගෙන් එකෙකි. අනෙකා නම් මතකයෙන් මේ පුවත මෙන මම්ම වෙමි.

**කරුණාරත්න අමරසිංහ**

එකල සේකරයෝ අවිවාහකයෙකි. රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ පරිවර්තක තනතුරෙන් සමු ගත් සේකරයන් ගුවන් විදුලියේ සේවයට පැමිණියේ 1960 අවුරුද්දේ යැ යි සිතමි. 'සක්වාලිහිණි' නමින් ඔහුගේ පළමු වැනි කාව්‍ය සංග්‍රහය පළ වූයේ ඔහු ගුවන් විදුලියේ 'නිබන්ධ සම්පාදක' තනතුර දරන කාලයේය. එකල සුනන්ද මහේන්ද්‍රයෝ සහ මම නිතර නිතර නානාවිධ ගුවන් විදුලි වැඩසටහන්වලට එකට මෙන්ම වෙන් වෙන්වද සහභාගී වීමු. ඒ ගිය හැම වාරයකම වාගේ නොවරදවාම මහගම සේකරයන්ගේ මේසය ළඟට ගොස් ඔහු සමඟ අල්ලාප සල්ලාපයේ පසුවීම අප දෙදෙනාගේම අනිවාර්ය චර්යාවක් විය.සුනන්දයන් මගින්ම පළමුව දැන හැඳින ගත් සේකරයන් පසුව සුනන්දයන් සමග මෙන්ම මා සමගද අතිශයින් කුලුපග වීම ඊට හේතු විය.මෙසේ සේකර හමුව කතා බහෙන් පසුවූ දවසක ඔහු අප දෙදෙනාට මෙසේ යෝජනාවක් කළේය.

"මේ සති අන්තෙ සුනන්දටයි කරුටයි බැරිද අපේ ගමේ එන්න. අපේ මහගෙදර රැයක් ගත කරන්න. මං නවකතාවක් ලිව්ව. මට ඕනැ ඒක ඔය දෙන්නට කියවන්න. කොහොම ලියවිලාද දන්නෙ නැහැ."

සේකරගේ ඉල්ලීමට එකඟ වූ අප ඒ සති අන්තයේ රදවානට ගියේ බසයෙනි. සුනන්දයනුත් මාත් රදවානෙප් සේකරයන්ගේ මහගෙදරට ලයා වන විට ඉර අවරට යන්න තිබුණි. සෙනසුරාදවක් වූ බැවින් තාර පාරද පාළුය. මහගමසේකරයෝ අප දෙදෙනා එන තුරු මඟ බලමින් සිටියෝය. කත පාවට හුරු නම් පයිල් බෑග් දෙකක ඔබාගෙන ගිය සරොම දෙකට බැස්ස අපට සේකරයෝ යෝජනාවක් ඉදිරිපත් කළහ.

"වෙල ළඟ වාහාට ගිහින් නා ගත්ත නම් සනීපෙ කියන්න බෑ. ඉර බහිනවත් බල බල වෙලේ හුලඟත් විඳ විඳ නා ගන්න පුළුවන්.යමුත් මහන්සියත් දුරු වෙලා යාවී."

එද හවස අපි දෙදෙනා සේකරයන් සමග ඔහුගේ මහගෙදරට නුදුරුව තාර පාර දෙපසට විහිදුණු වෙල්යාය මැදින් ගලන ඇළට නොයි ගිලී ගිලී පීනමින් ඉර හැංගෙන තුරුම නැවෙමු. සේකරයන් දිය බුං ගසමින් ඒ මෙ අත පීනමින් නැවෙ පාසල් දරුවෙකු සේ සතුටින් ඉපිලෙමිනි. ඔහු එකවිගල් මහ හඬින් නැඟූ සතුටු සිනා හඬ මේ දැන් ඇසෙන්නා සේය. පීනීම එතරම් හුරු නැති සුනන්දයන් නෑමේ හොඩ නැවීයේ නිදය.

එද ඒ මඳ පමණ නාළිකේර මදිරා මද මුදිතව බත් කෑ අපි ඉස්තෝප්පුවේ පැදුරු එලා ගත්තෙමු. සේකරයෝ විම්නි ලාම්පුවක් රැගෙන විත් ඉස්තෝප්පුවේ කොට කාප්පය උඩ තැබූහ. අනතුරුව ඊට ළං කොට ගත් ඇඳි පුටුවක හෙලකුල් උඩට නගන වාඩිවූ සේකරයන් තම ඔඩොක්කුවේ තබාගත් නවකතා අත්පිටපත කියවන්නට පටන් ගත්තේ සිගරැට්ටුවක්ද දල්වා ගනිමිනි. රදවානේ සේකරයන්ගේ මහගෙදර පැල් තිබූ ඉස්තෝප්පුවේ බිම පැදුරුවල දිග ඇදී ගත් අපි දෙදෙනා ගන අඳුර මඳ අඳුරට හැරවූ විම්නි ලාම්පු එළියෙන් එද ඔහු තම පළමු වැනි නවකතාව කියවද්දී ඒ බෝ වන තුරු ඊට ආසාවෙන් සවන් දී සිටියෙමු.

එය රමණීය ප්‍රේම වෘත්තාන්තයකි. සේකරයන් අතින් එය ලියැවී තිබුණේ අතිශය හෘදයංගම කාව්‍යමය බස් වහරකිනි. පාරම්පරික සාහිත්‍ය සිංහලයේ භාෂා මාධූර්යයෙන් මහගමසේකරයන් ලත් තිවූ භාස්වාදයේ විශිෂ්ට ඵලයක් ලෙස එය හැඳින්විය හැකිය. එම නවකතාව හුදු ප්‍රේම කතාවක්ම නොවේ. එය දූකලී එක්තරා කලාකාරියකගේ සහ කවියෙකුගේ භාවමය ජීවිතයට උරුම වූ සංකීර්ණ චෛතසික සංඝට්ටනයක් සෞන්දර්යාත්මක නිර්මාණයකට හැරවීමක් වැන්න.

පසු ද උදේ සුනන්දයන් සහ මා සේකරයන්ගෙන් සමු ගෙන රදවානේ මහගෙදරින් පිට වූයේ සේකරයන්ගේ අම්මා පිළිගැළ කර දුන් පාතරාසයද අනුභව කොටය. සේකරයන්ගේ අම්මා සකස් කර තිබූ දුම් දනා අලුත් හාලේ බතද. ඉඳ හිට හින් ලුණු කැටයක් දෙකක් අතරින් පතර හැපෙන හොඳට දෙහි ඇඹුල් දැමූ පොල් සම්බෝලය සහ පුහෙණි ගිල්වා පදමට බැද තිබූ උාරල් රස නැති නයිය කට්ට කරවල බැදුමද සහිත ඒ උදේ ආහාර වේලෙහි රස මට තිසි ද අමතක නොවන්නකි. ඇතැඳ සුනන්දයන් සහ මා ඒ පිනි බොජුනෙහි අනුසස් ආසාවෙන් පවසන සම්භර අවස්ථා ඇත.

එද අප දෙදෙන සේකරයන්ගේ මහගෙදර වත්තෙන් තාර පාරට පැමිණ බස් නැවතුම්පළට වී කොළඹ බසය එනා තුරු බලා සිටියදී එක් වරම සුනන්දයන්ගේ කටින් පිට වුණේ මේ වදන් පෙළය.

"කරු , සේකරගෙ නවකතාව හරි අපූරුවට ලියවිලා තියෙනවා නේද? මම ආසාවෙන් අහගෙන හිටිය. අපි හොඳට දන්න චරිතෙ ඒ නවකතාව ඇතුළෙ ඉන්නෙ! ප්‍රධාන චරිතෙ මට පණ පිටින් පෙනුණ.යැබැයි සේකර ඔය නවකතාව පළ කරයිද කියන එක ප්‍රශ්නයක්!"

සුනන්ද මහේන්ද්‍රයන් එද අනුමාන කළ ලෙසම සේකරයෝ ඔහුගේ පළමු නවකතාව පළ කිරීමට නොසිතූහ. අවසානයේ ඔහු ඊට සුමිත් කරන්නට ඇද්ද යන්න තවමත් රහසකි!

(මෙහි පළ වන සේකර රූප වනාහි ලෙන්හවුසියට ආ සේකරයන් 'සරසවිය' කතු මඩුල්ලේ සෝමවීර සේනානායකයන්ගේ මේසය ළඟ වාඩිවී සිටියදී 'සරසවිය' ඡායාරූප ශිල්පී බන්දු එස්. කොඩිකාරයන් විසින් ඔහුටත් නොදැනී ගන්නා ලද්දක් බව 'සේකර සමර' සමිරූ නලාවට ලිපියක් ලියන පර්සි ජයමාන්නයෝ හෙළි කරති.)